දුරකථන ) 011 2669192 , 011 2675011
தொலைபேசி ) 011 2698507 , 011 2694033
Telephone ) 011 2675449 , 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) MA/MS/B/04/2016
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 22.11.2016
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார, போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරු,

සියළුම පළාත්/ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු,

සියළුම ශික්ෂණ/ මහ රෝහල්හි අධ්‍යක්ෂවරු,

සියළුම මූලික රෝහල්හි වෛද්‍ය අධිකාරී වරු.

සියළුම දිස්ත්‍රික් රෝහල්හි දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන්,

සියළුම මෙම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා ව්‍යාපාරවල අධ්‍යක්ෂවරුන්,

<u>2013,2014,2015 හා 2016 වාර්ෂික ස්ථාන මාරු නියෝග මත මුදා හැරීම</u>

වාර්ෂිකව සෞඛ්‍ය අමාත්‍යාංශය විශාල කාලයක් හා ශ්‍රමයක් වැය කර වෛද්‍ය නිලධාරී වාර්ෂික ස්ථාන මාරු ලේඛන සකස් කරන නමුත් මෙය නිසියාකාරව ක්‍රියාත්මක නොවීම නිසා රෝහල් තුල විවිධ අර්බුදකාරී තත්වයන් පැන නැගී ඇති බවට විවිධ පැමිණිලි ලැබෙමින් පවතී. මෙමගින් ස්ථාන මාරු මගින් නිදහස් වීමට සිටින වෛද්‍ය නිලධාරීන් මෙන්ම ආයතන ප්‍රධානීන් ද දැඩි අපහසුතාවයකට පත් වී ඇත. උදාහරණ ලෙස 2016 වාර්ෂික ස්ථාන මාරු ලැයිස්තුව සැලකීමේදී මේ වන විටත් ස්ථාන මාරු ක්‍රියාත්මක වී ඇත්තේ 20% පමණ ප්‍රමාණයකි.

**02.** ස්ථාන මාරු ක්‍රියාත්මක කරවීම ආයතන ප්‍රධානීන් සතු වගකීමක් බැවින්, මේ පිළිබද සොයා බලා සුදුසු අභ්‍යන්තර වැඩපිළිවෙලක් සකස් කරමින් සේවා කටයුතු අඩාල නොවන පරිදි ස්ථානමාරු නියෝග කඩිනමින් ක්‍රියාත්මක කරවන මෙන් ඉල්ලා සිටිමි. මෙම ස්ථානමාරු නියෝග ක්‍රියාත්මක කිරීමේදී තාවකාලිකව ඔබ ආයතනයෙහි විවිධ ඒකකයන්හි සේවාවල යම් පසුබෑමක් ඇති වුවද, එය ස්ථානමාරු ක්‍රියාත්මක කොට අවසන් වූ පසු මගහැරී යනු ඇත. මෙම ස්ථානමාරු ක්‍රියාත්මක කිරීමේදී අනෙකුත් රෝහල් අධ්‍යක්ෂවරුන් සහ පළාත්/ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන් අතර මනා සන්නිවේදනයක් පවත්වා ගැනීම තුළින් පැන නගින ගැටලු අවම කර ගත හැකිවේ.

**03.** 2016 නොවැම්බර් 30ට පෙර සියලුම ස්ථාන මාරු ක්‍රියාත්මක කර 2016 දෙසැම්බර් 10ට පෙර ප්‍රගතිය මා වෙත වාර්තා කරන ලෙස ද දන්වා සිටිමි. යම් ඒකකයක අපහසුතා තිබෙනම් ඒ ගැන සාධාරණීකරණ වාර්තාවක් මා වෙත ඉදිරිපත් කර නැවත අනුයුක්තයක් ලබා ගැනීමට කටයුතු කරන්න.

**04.** මෙම නියෝගය ක්‍රියාත්මක කිරීමට සියලුම ආයතන ප්‍රධානීන් බැඳී සිටින අතර, එය පැහැර හරින නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහය අනුව කටයුතු කරන බවද දන්වා සිටිමි.

ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

අනුර ජයවික්‍රම
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත -

1. විගණකාධිපති - දැ.ගැ.පි
2. ලේකම් - රා. සේ. කො. ස. - දැ.ගැ.පි